රට පුරා පැතිර පවතින කොවිඩ්-19 වසංගත රැල්ල සමගින්, සෑම සියළු දෙනෙකුම කොවිඩ්-19 මර්දනය සඳහා හඳුන්වා දී ඇති සමාජ දුරස්ථකරණය, මුඛ ආවරණ පැළඳීම ඇතුළු සෞඛ්‍ය නිර්දේශයන් නිසියාකාරයෙන් පිළිපැදීම අත්‍යාවශ්‍ය වේ. එසේම ඒ සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීම සහ, එම සෞඛ්‍ය නිර්දේශ පිළිපදින මෙන් නැවත නැවත සිහිකැඳවීමද මාධ්‍ය සතු වගකීමකි.

නමුත්, එම මාධ්‍ය වගකීම ඉෂ්ට කිරීමේදී, පුද්ගලයෙකුට සිය පෞද්ගලිකත්වය සඳහා ඇති අයිතිය කඩ වන්නේ නම් හෝ පුද්ගල ගරුත්වය ආරක්ෂා නොවෙන්නේ නම්, එය ගැටළුවක් නොවන්නේ දැයි පාඨකයන් ලෙසින් අප විමසිය යුතුවේ.

ඊට උදාහරණ ලෙසින් දිනමිණ පුවත්පතේ (08/30) "නිරෝධායන නීති අමතක කරමින්" යන සිරස්තලය ඔස්සේ පළව තිබූ විශේෂාංගය දැක්විය හැක. එහි දැක්වුණු පුද්ගලයින්ගේ මුහුණු දක්වා තිබුණේ, ඔවුන්ගේ අනන්‍යතාවයන් ආරක්ෂා කිරීමට කිසිදු උත්සාහයක් නොගනිමිනි.

මෙසේ පුද්ගලයන්ගේ අනන්‍යතාවය නිරාවරණය නොකොට, නිරෝධායන නීති පිළිපැදීමේ වැදගත් කම සඳහන් කිරීමට සහ නිරෝධායන නීති පිළිපදින ලෙසින් සිහිකැඳවීමට මාධ්‍යයකට නොහැකිද? මේ පිළිබඳ ඔබේ අදහස කුමක්ද?

**#MediaEthicsSL #lka #sinhalanews #Dinamina**